නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා අප ඉදිරියේ සිටියදී අපි හජ්ජතුල් වදා සම්බන්ධයෙන් කතා කරමින් සිටියෙමු. හජ්ජතුල් වදා යනු කුමක් දැයි අපි නොදැන සිටියෙමු.

ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කරන ලදී. “නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා අප ඉදිරියේ සිටියදී අපි හජ්ජතුල් වදා සම්බන්ධයෙන් කතා කරමින් සිටියෙමු. හජ්ජතුල් වදා යනු කුමක් දැයි අපි නොදැන සිටියෙමු. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) අල්ලාහ්ට ප්රශංසා කොට ඔහුව පැසසුමට ලක් කළේය. පසුව එක් ඇසක් පොට්ට මහා බොරුකාර දජ්ජාල් ගැන මෙනෙහි කළේය. ඔහු ගැන මෙනෙහි කිරීමේදී එතුමා මෙලෙස දන්වා සිටියහ. “කිසිදු නබිවරයකු ඔහුගේ සමූහයාට ඔහු ගැන අවවාද කිරීමෙන් තොරව එව්වේ නැත. ඔහු ගැන නූහ් හා ඔහුගෙන් පසු නබිවරුන් ද අවවාද කළේය. සැබැවින්ම ඔහු නුඹලා අතර ඔහු හෙළි වූයේ නම්, ඔහුගේ කරුණු කිසිවක් ඔහු නුඹලාට සඟවන්නේ නැත. නුඹලා වෙත සැඟවෙන්නේ ද නැත. සැබැවින්ම නුඹලාගේ පරමාධිපති එක් ඇසක් පොට්ට අයකු නොවේ. නමුත් සැබැවින්ම ඔහු දකුණු ඇස පොට්ටයෙකු වන්නේය. ඔහුගේ එම ඇස නෙරා ඇති මිදි ගෙඩියක් මෙන් වේ. දැනගනු. නුඹලාගේ මේ දිනයේ නුඹලාගේ මේ නගරයේ නුඹලාගේ මේ මාසයේ තහනම් කර ඇත්තාක් මෙන් සැබැවින් අල්ලාහ් නුඹලාගේ ජීවිත හා නුඹලාගේ සම්පත් (විනාශ කිරීම) නුඹලා කෙරෙහි තහනම් කර ඇත්තේය. මම නුඹලාට දන්වා සිටියෙම් ද? ඔවුහු: එසේය. යැයි පැවසුවෝය. ඔහු: ‘අහෝ අල්ලාහ් සාක්ෂි දරනු’ යැයි තුන්වරක්
පැවසීය. “අහෝ! හොඳින් බලනු. මගෙන් පසුව නුඹලා එකිනෙකා ගෙලවලට පහර දෙන දේවත්වය ප්රතික්ෂේප කරන්නන් බවට හැරී නොයනු.”
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මාර්ගයේ සිටියදී හජ්ජතුල් වදා යනු කුමක් ද? යැයි අපි විමසා සිටියෙමු. හජ්ජතුල් වදා යනු කුමක්දැයි අපි නොදැන සිටියෙමු. හජ්ජතුල් වදා යනු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා හිජ්රි දහවන වර්ශයෙන් ඉටු කළ අවසන් හජ් වන්දනාවයි. එහිදී එතුමා ජනයාගෙන් සමු ගත්තේය. ඇසක් පොට්ට මහාබොරුකාර දජ්ජාල් පිළිබඳ මෙනෙහි කළේය. ඔහුගේ කරුණෙහි බරපතලකම පෙන්වූහ. ඔහු ගැන ප්රවේසම් වන මෙන් දන්වා සිටියහ. පසුව සියලුම නබිවරුන් තමන්ගේ සමූහයාට දජ්ජාල් ගැන අවවාද කර සිටි බවත් ඔවුන් ඉදිරියේ ඔහුගේ කරුණ ගැන ඔවුනට බිය ගන්වා බලවත් සේ පැවසූ බවත් සැබැවින්ම ඔහු නුඹලාට සැඟවෙන්නේ නැති බවත් දන්වා සිටියේය. නුඹලාගේ පරමාධිපති පොට්ටයෙකු නොවේ. නමුත් ඔහු වනාහි දකුණැස පොට්ට නෙරා ඇති මිදි ගෙඩියක් මෙන් පවතින කෙනෙකි පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා මෙසේ පැවසූහ. හජ් අවුරුදු දිනයේ ගෞරවය මක්කාවේ ගෞරවය දුල් හිජ්ජා මාසයේ ගෞරවය මෙන්ම සැබැවින්ම අල්ලාහ් නුඹලාගේ ප්රාණ නැසීම කිසිදු යුක්තියකින් තොරව නුඹලාගේ සම්පත් පැහැර ගැනීම තහනම් කොට ගෞරවය කර ඇත්තේය. පසුව නුඹලාට දන්වා සිටීමට නියෝග කරනු ලැබූ දෑ මම නුඹලාට දන්වා සිටියෙම් ද? යැයි එතුමා විමසූහ. ඔවුහු: ‘එසේය’ යැයි

පැවසූහ. එතුමා: අහෝ අල්ලාහ් මම ඔවුන්ට දන්වා සිටීම සම්බන්ධයෙන් ඔවුන් ඉදිරිපත් කරන සාක්ෂියට ඔබ සාක්ෂි කරුවකු සිටින්න’ යැයි තුන්වරක් පැවසීය. අනතුරුව මින් පසුව එකිනෙකා මරා ගන්නා දේවත්වය ප්රතික්ෂේප කරන්නන් මෙන් නොවන මෙන් ද එතුමා ඔවුනට නියෝග කළහ.

https://sunnah.global/hadeeth/si/show/5829

